## බැලිස්ටික් මිසයිල ප්‍රහාරයකදී ගත යුතු ක්‍රියාමාර්ග (අමාත්‍යමණ්ඩල ලේකම්)

බැලිස්ටික් මිසයිල ප්‍රහාරයකදී ජපානයටද මිසයිල ප්‍රහාර ඇති වීමේ ඉඩකඩ ඇත.ජපානයටද එවන් මිසයිල ප්‍රහාරයකට මුහුණ දීමට සිදුවුවහොත් ජපානය ඇතුළත එම පණිවිඩය හදිසි තොරතුරු පද්ධතිය යටතේ ඔබගේ ජංගම දුරකතනයට කෙටිපණිවිඩයක් මගින් දැනුම් දීමටද ,ජපානයේ ක්‍රියාත්මකව පවතින"J-Alert" පද්ධතිය මගින් දැනුම් දීමද සිදුකරනු ලබයි.

❶ඉක්මනින් එම ස්ථානයෙන් ඉවත්වීම

❷නිවැරදි හා සත්‍ය තොරතුරු පමණක් එකතුකර ගැනිම

❖ රජයේ උපදෙස් අනුව ,සන්සුන්ව තම ආරක්ෂක ක්‍රියාමාර්ග සපයා ගැනිම

### සිවිල් ආරක්ෂක අඩවිය

http://www.kokuminhogo.go.jp/en/pc-index e.html ( ඉංග්‍රීසියෙන්)

(උදාහරණයක් වශයෙන්) වහාම ඉවත් වීම,ආරක්ෂාකාරී පිළිවෙත් අනුගමනය ,වහාම ආරක්ෂාකාරී ස්ථානයකට ඇතුල් වීම,ආදී වශයෙන් තම ආරක්ෂාව සපයා ගැනිම .මිසයිල කොටස් විසිවීමෙන් ආපදා ඇති විය හැකි බැවින් එම සෑම අවස්ථාවකදිම තම ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වීම.

**එවන් පණිවිඩයක් ලැබුණු වහාම ,**

**කරුණාකර සන්සුන්ව ක්‍රියාත්මක වන්න**

එවන් අවස්ථාවක ඔබ එළිමහනේ රැඳීසිටින්නේ නම්, වහාම ශක්තිමත් ගොඩනැගිල්ලක භූගත මහල වෙත හෝ ළඟම ඇති සාප්පු සංකීර්ණයක භූගත මහලක් ඇතුළට යන්න.

නමුත් එවන් අවස්ථාවක අසල කිසිදු ගොඩනැගිල්ලක් නොතිබුණහොත් ,අවට ඇති ගසකට හෝ මුවාවී මුහුණ බිමට හරවා ඔබේ හිස ආරක්ෂා කරගන්න.

එවන් අවස්ථාවක ඔබ වීදුරු සහිත (ජනේල් හෝ ආවරණයක් නොමැති ගොඩනැගිල්ලක රැදී සිටින්නේනම්, ආවරණයක් සහිත ස්ථානයකට ඉක්මනින් ඉවත් වන්න.වීදුරු හෝ ජනේල් නොමැති ස්ථානයකට ගොස් ආරක්ෂාව සපයාගත හැකිනම් වඩාත් සුදුසු වේ.

**ඔබ අසල ඉතා සමීප ස්ථානයකට මිසයිල ප්‍රහාරයක් එල්ලවූ අවස්ථාවක ,**

●ඔබ එළිමහනක රැදී සිටින්නේනම් ,ලේන්සුවක් හෝ එයට සමාන වෙනයම් දෙයකින් හෝ ඔබගේ මුඛය හා නාසය ඉක්මනින් ආවරණය කරගන්න.අසල ඇති ගොඩනැගිල්ලකට හෝ ඔබට වඩාත් ආරක්ෂාකාරී යැයි සිතෙන අසල පිහිටි ස්ථානයකට ඉක්මනින් ගොස් ආරක්ෂාවන්න.

●ඔබ එවන් අවස්ථාවක ගෘහස්ථව රැදී සිටින්නේනම්,එම ගොඩනැගිල්ල වෙත වාතාශ්‍රය ඇතුල් වන කවුලු සහ විදුලි පංකා ඉක්මනින් වසා දමන්න .ඉක්මනින් එම ගොඩනැගිල්ලේ පිහිටි ආරක්ෂාකාරි ස්ථානයකට ගොස් ආරක්ෂාවන්න.